# දෙවිට ඕනෑ කරන දේ ඔබට සොයාගත හැකි අන්දම

***බයිබලයේ තිබෙන්නේ කුමන වැදගත් තොරතුරුද? (1)***

***බයිබලයේ කර්තෘ කවුද? (2)***

***ඔබ බයිබලය පාඩම් කළ යුත්තේ ඇයි? (3)***

1. බයිබලය දෙවිගෙන් ලැබී තිබෙන වටිනා තෑග්ගක්. එය හරියට, ප්‍රේමනීය පියෙකු තම දරුවන්ට එවන ලිපියක් වගෙයි. එය අපට දෙවි ගැන සත්‍යය කියා දෙනවා. එනම් දෙවි කවුද, ඔහුගේ ප්‍රමිති මොනවාද යන්න පැහැදිලි කරනවා. අප මුහුණ දෙන ගැටලු සමඟ සාර්ථකව කටයුතු කරන අන්දම මෙන්ම සැබෑ සන්තෝෂය සොයාගන්නේ කෙසේද කියාත් එය පැහැදිලි කරනවා. දෙවිව සතුටු කිරීමට කුමක් කළ යුතුද කියා අපට පවසන්නේ බයිබලය පමණයි.—ගීතාවලිය 1:1-3; යෙසායා 48:17, 18.

2. විවිධ පුරුෂයන් 40දෙනෙකු විසින් පො.යු.පෙ. 1513 සිට, අවුරුදු 1,600ක කාලපරිච්ඡේදයක් පුරා බයිබලය ලියනු ලැබුවා. එය කුඩා පොත් 66කින් සමන්විතයි. බයිබලය ලිවූ අය එය ලිව්වේ දේවානුභාවයෙන්. ඔවුන් ලිව්වේ තමන්ගේ අදහස් නෙවෙයි. ඒ වෙනුවට දෙවිගේ අදහස්. ඒ නිසා බයිබලයේ කර්තෘ ස්වර්ගයේ සිටින දෙවි මිස, පොළොවේ සිටින කිසිම මිනිසෙක් නෙවේ.—2 තිමෝති 3:16; 2 පේතෘස් 1:19, 21.

3. බයිබලය නිවැරදිව පිටපත් කිරීමටත්, සුරැකීමටත් දෙවි වගබලා ගත්තා. වෙනත් කිසිම පොතකට වඩා බයිබලයේ පිටපත් මුද්‍රණය කොට තිබෙනවා. ඔබ බයිබලය පාඩම් කරනවා දැකීමට හැමෝම සතුටු වෙන්නේ නැහැ. නමුත් ඔබව නතර කිරීමට එයට ඉඩ දෙන්න එපා. ඔබේ සදාකාල අනාගතය රඳා පවතින්නේ, විරුද්ධවාදිකම් මධ්‍යයේ දෙවිව දැනගැනීමත් ඔහුගේ කැමැත්ත කිරීමත් මතයි.—මතෙව් 5:10-12; යොහන් 17:3.

